ආයතනයේ නම : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ඉණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

நிறுவனத்தின் பெயர்: தேசிய மிருகக்காட்சிசாலைகள் திணைக்களம்

பாராளுமன்றத்திக் அரசகணக்குக் குழவினால் முன்வைக்கப்பட்டஅறிக்கைதொடர்பாகநிலையியற்கட்டளைஇலக்கம் 119(4) இன் கீழ் கௌரவஅமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அதுதொடர்பாகஎடுக்கப்படும் நடவடிகைகளும் பாராளுமன்றத்திற்குசமர்ப்பித்தல்

Name of the institution: Department of National Zoological Gardens

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No 119 (4)

පාර්ලිමේන්තු සැසිවාර අංකය : 183

ආයතනයේ නම : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

	මූල්‍ය නීතිරීති හා කාර්ය සාධන ඇගයීම ප්‍රකාරව හඳුනාගන්නා ලද දුර්වලතා	ඒ සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග හා ඒවායේ වර්තමාන තත්වය
	පළමු කොටස	
01.	පුද්ගල පඩිනඩි ලේඛනය/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	2022 වර්ෂයේ සිට පුද්ගල පඩිනඩි ලේඛන වැටුප් ගෙවනු ලබන මාසය තුල දිම යාවත්කාලීන කිරීම සිදු කර ඇත.
02.	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු බොහෝ අවස්ථාවලදී මසක් ඇතුලත සපයා ඇති අතර ඇතැම් අවස්ථාවලදී උප කාර්යාල මඟින් පිළිතුරු ගෙන්වා ගැනීමේ දී ප්‍රමාද වීම් සිදුව ඇත. 2023 වර්ෂයේ සිට මෙම තත්ත්වය වලක්වා ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි.
03.	විගණන හා කළමනාකරණ කමිටු අවම වශයෙන් රැස්වීම් වාර 2ක් වත් පවත්වා නොතිබුණි.	2020 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව විසින් 2020.07.29 දින විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමක් පවත්වා ඇත. 2020 වර්ෂය තුල රට තුල පැවති කොරෝනා වසංගත තත්ත්වය හා ප්‍රධාන අභ්‍යන්තර විගණක හදිසි අනතුරකට භාජනය වීම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් නොපැවැත්වීම සඳහා හේතු වී ඇත. එසේම කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති අංක DMA/AMC/A/2020/5-4 හා 2020.06.11 දිනැති ලිපිය මඟින් DMA/01-2019 චක්‍රලේඛයේ 5 ඡේදය ඉටුකිරීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීමක් ද සිදුකර ඇති බව වැඩිදුරටත් දන්වා සිටිමි. මෙවන විට DMA/01-2019 චක්‍රලේඛය පරිදි වර්ෂයට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පවත්වා දෙපාර්තමේන්තුවට අදාළ වැදගත් කරුණු සාකච්ඡා කරනු ලබන බව ද දන්වා සිටිමි.
04.	2016.03.31 දිනැති අංක 5/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.	2020 වර්ෂයේ පැවති කොරෝනා වසංගත තත්ත්වය හමුවේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු නියමිත කාල සීමාවන් තුල දී ඉටු කිරීමට නොහැකි වූ අතර 2020 හා 2021 වර්ෂයන්ට අදාළව උප කාර්යාල 02ක වෙන්දේසි කටයුතු මේ වන විට අවසන් කර ඇති අතර 2022 වර්ෂයේ සමීක්ෂණ කටයුතු අවසන් වීමත් සමඟ අනෙක් ආයතනයන්හි භාණ්ඩ වෙන්දේසි කටයුතු අවසන් කිරීමට අපේක්ෂා කරන බව වැඩිදුරටත් දන්වා සිටිමි.
05.	වාහනයක් ගර්හිත වී මාස 6 කට වඩා අඩු කාලයක දී අපහරණය කර නොතිබුණි.	අපහරණය කළ යුතු වාහන තක්සේරු කිරීම සඳහා කමිටුවක් පත් කිරීම සිදුකර ඇති නමුත් මේ වනවිට රට තුල පවතින ආර්ථික තත්ත්වය මත නව වාහන මිල දී ගැනීම අත්හිටුවා ඇති බැවින් අපහරණය කිරීමට ඉදිරිපත් කරන ලද වාහන නැවත අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හැකි තත්ත්වයට පත් කරන ලෙස විගණන කළමනාකරණ කමිටු රැස්වීම් වල දී සාකච්ඡා කර ඇති බැවින් මේ වන විට ඒ අනුව කටයුතු සිදුකරන බව කාරුණිකව දන්වා සිටිමි.
06	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ ප්‍රකාරව මසක් තුළ නිරවුල් කර නොතිබුණි.	2020 වර්ෂයේ දී පැවති කොරෝනා වසංගත තත්ත්වය මත ආයතන වසරේ වැඩි කාල සීමාවක් වසා පැවතීමත්, තැපැල් සේවාවන් අක්‍රියව පැවතීමත් මත බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව පැවති ශේෂ සම්බන්ධයෙන් මසක් ඇතුලත කටයුතු කිරීමට නොහැකි වූ අතර මේ වනවිට එම සියලුම ගැලපුම් නිවැරදි කිරීම

		සිදුකර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. එසේම මෙවන විට බැංකු සැසඳුම් ප්‍රකාශ මඟින් අනාවරණය වන ගැලපුම් මසක් ඇතුළත නිරවුල් කිරීමට කටයුතු කර ඇති බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.
07.	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන ගිහ ණය ශේෂ පැවතුණි.	වර්ෂයකට වඩා වැඩි කාලයක් සිට පැවත එන ණය ශේෂයන්ගෙන් ඇපකරුවන් සහිත ණය ශේෂයන් ඇපකරුවන් මඟින් අයකර ගැනීමට කටයුතු කර ඇති අතර ඇපකරුවන් නොමැති ණය ශේෂයන් අය කර ගැනීම සඳහා ආයතන සංග්‍රහය අනුව කටයුතු කරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි.
08.	මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කළ තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොනිබුණි.	ප්‍රායෝගිකව පැන නැඟුන ඇතැම් තත්ත්වයන් හේතුවෙන් ලබා ගන්නා ලද තත්කාර්යය අතුරු අග්‍රිම මාසයක් තුල නිරවුල් කිරීම සිදුකර නොමැති අතර මේ වන විට මෙම තත්ත්වය හැකිතාක් වලක්වා ගැනීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.
09.	සමාලෝචිත වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු කාර්ය සාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත් කර නොනිබුණි.	2020 වර්ෂයේ පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් වසරේ වැඩි කාල සිමාවක් ආයතනය වසා දැමීම හේතුවෙන් වාර්ෂික කාර්යය සාධන වාර්තාව සකස් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා ගැනීමේ හා වාර්තාව පිළියෙල කර මුද්‍රණය කර ගැනීමේ ප්‍රමාදයක් ඇති වූ බව කාරුණිකව දන්වා සිටිමි. 2020 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව 2021.12.01 දින පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම සිදුකර ඇත. 2022 වර්ෂය සඳහා නියමිත වාර්ෂික කාර්ය සාධනය වාර්තාව මේ වන විට සකස් කරමින් පවතින අතර එය දින 150 ඇතුලත පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන බව වැඩිදුරටත් දන්වා සිටිමි.
		දෙවන කොටස
01	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී නිබු පුහුණු අවස්ථා ප්‍රමාණය 50% වඩා අඩු මට්ටමක පැවතුණි.	2020 වර්ෂයේ දී පැවති කොරෝනා වසංගත තත්ත්වය මත නිලධාරීන් පුහුණු වැඩසටහන් සඳහා සහභාගි කරවීම සිදුකර නොමැති අතර 2021 වර්ෂයේ දී මුල්‍ය පාලන වැඩසටහන් ක්‍රියාත්මක වීම හමුවේ පුහුණු අවස්ථා ලබා දීම සිදුකර නොමැත. එහෙත් 2022 වර්ෂයේ දී අත්‍යාවශ්‍ය වූ පුහුණු වැඩසටහන් 05ක් සඳහා නිලධාරීන් 58ක් සහභාගි කරවා ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

.....

ආර්.එම්.සී.එම්. හේරත්
ලේකම්
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය

ආර්.එම්.සී.එම්. හේරත්
ලේකම්
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ
අමාත්‍යාංශය

.....

ආචාර්ය තිලක් ප්‍රේමකාන්ත
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

ආචාර්ය තිලක් ප්‍රේමකාන්ත
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව
අනගාරික ධර්මපාල මාවත,
දෙහිවල